# සරුංගලේ ඇතට ගියා..

ලංකා පෙරේරා



ජාතික විද්‍යා පදනම

# සරුංගලේ ඈතට ගියා

ලංකා පෙරේරා

චිත්‍ර
අනුර ශ්‍රීනාත්

NATIONAL SCIENCE FOUNDATION

**ප්‍රකාශනය**
ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

© ජාතික විද්‍යා පදනම 2009

**ISBN 978-955-590-099-7**

ප්‍රකාශන සම්බන්ධීකරණය: නදීරා ජයවීර
අකුරු සැකසුම සහ පිටු නිර්මාණය: දිමුතු ජයමාලි වීරසූරිය

මුද්‍රණය
W. D. C. සමූහ ව්‍යාපාර (මුද්‍රණකරුවෝ)
16, ගාලු පාර
ගල්කිස්ස

ආදරණීය දුවේ, පුතේ,

මේ කතන්දරය අකුණු පිළිබඳවයි. අකුණු ගැසීම අපට බහුලව දක්නට ලැබෙන ස්වභාවික ක්‍රියාවලියක්.

අපේ රටේ බහුලව ඇති වන ස්වභාවික විපත් පිළිබඳව ඔබව දැනුවත් කිරීම අපේ වගකීමක්. මෙවැනි ආපදා පිළිබඳව දැනුවත් වීම මගින් ඉන් අපට හා රටට සිදුවන දේපල, ජීවිත හානිය අඩු කර ගන්න පුළුවන්.

ජාතික විද්‍යා පදනම, දූ දරුවන් වෙනුවෙන් ස්වභාවික ආපදා පිළිබඳව කතන්දර පොත් පෙළක් පළ කරන්න තීරණය කළේ මේ නිසයි.

සුනාමියට පසු ඒ පිළිබඳව ලියැවුණු 'මුහුද කළු වුනා' පොත අපේ පොත් පෙළේ පළමු පොත ලෙස ප්‍රකාශයට පත් කළා. ඒ පොත හුගාක් ජනප්‍රිය වුනා. ළමා පොතක් ලෙසට සාහිත්‍ය සම්මානයෙනුත් පිදුම් ලැබුවා.

ආදරණීය දුවේ පුතේ අපි ස්වභාවික ආපදා පිළිබඳව හොඳින් දැනුවත් වෙමු.


මෙහි එන හිරුණි, සුමුදු, ගයානි හා අචිනි යන දරුවන් සිවු දෙනා වෙල් එළියක සරුංගල් යවමින් සිටිනවා. එහි පැමිණෙන සිමියොන් සීයා නම් වැඩිහිටියෙක් දුන් අවවාදයක් පිළිපැදීම මගින් ඔවුන් සිදුවන්නට ගිය විශාල අනතුරකින් බේරෙනවා.

මේ කතන්දරය කියවා ඔබත් හොඳින් දැනුවත් වන්න. ඔබ ඉගෙන ගත් දෙය ගැන ඔබේ යහළුවනුත් දැනුවත් කරන්න.

ජාතික විද්‍යා පදනම
47/5 , මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07.

ලොව සියලු දූවා දරුවන්ට

ආදරයෙනි...



''චූටි දුව... චූටි දුව... නැගිටින්න. කීය ද දැන් වෙලාව? ඉස්කෝලේ නිවාඩු හින්ද හොඳයි. අන්න ඔයාගේ යාළුවෝ ටික ඇවිල්ලා.''

''ආ... යාළුවෝ ඇවිල්ලා. අනේ අම්මේ මට නින්ද ගියා.''

නිදිගැට අරිමින් සිටි හිරුණි ඒ සැණින් ඇඳෙන් බිමට පැන්නා ය.

වහා සාලයට දිව ගිය හිරුණි මිදුලේ සිටින සුමුදු, ගයානි, අචිනි... යාළුවෝ දුටු සැණෙන් ''ඉන්න තප්පරයයි. මම ලෑස්තියි'' කියමින් ඔවුන් සාලයේ වාඩි කරවා සූදානම් වන්නට ගියා ය.

''අද ඔයාලා මොනවද කරන්නේ?'' හිරුණිගේ අම්මා යාළුවන් සමඟ කතාබහක යෙදුණා ය.

''ඇන්ටි අපි අද හිතාගෙන ඉන්නේ පහළ වෙල් එළියට ගිහිල්ලා මෙන්න මේ සරුංගලය උඩ අරින්න'' කියමින් ඔවුහු තමන් ගෙනා සරුංගල පෙන්නන්ට වූහ.

''ඔන්න හිරුණිත් ඊයේ අයියත් එක්ක එකතු වෙලා සරුංගලයක් හැදුවා. ඒක තමා මේ.''

''ඔන්න මම ලෑස්තියි'' කියමින් හිරුණි සාලයට ආවේ සරුංගලයක් ද අතැතිව ය.

''දුව, ඔයා කෑව ද?... තේ බීවා ද?''

''ඔව් ඔව් අම්මේ කෑවා විතරක් නෙවෙයි. අරන් යන්නත් ඔතා ගත්තා.''

''මේ..'' කියමින් පාර්සලයක් පෙන්වූවා ය.

''එහෙනම් අම්මේ අපි යනෝ''  කියමින් යාළුවන් පිරිවරාගත් හිරුණි වෙල් එළියට එක පිම්මේ දුවන්නට වූවා ය.

''මේ දරුවනේ, පරෙස්සමෙන්... වැඩි දුරකට එහෙම යනවා නොවේ''  අම්මා තරවටුවක ස්වරූපයෙන් කීවාය.

වෙල් එළියේ ඉපනැල්ල උඩින් පැන පැන යන දරුවෝ සරුංගල් පසෙකින් තබා වක්කඩ ළඟට එක් වූහ.

ඔවුන් තිත්ත පැටවුන් උඩ පනිමින් එහා මෙහා පීනන අයුරු බලා සිටියේ මහත් සතුටිනි.

ඔවුන් ආසන්නයේ ඇති දං ගහ ළඟට ගිය සුමුදු වැටී ඇති දං ගෙඩි අහුලන්නට වූවාය.  තවමත් පිණිබිඳු ළා තණ කොළ මත දිළිසෙන්නේ මුතු කැට මෙනි.

පුංචි දෙපාවලින් පෑගුණ තණ පත් ඔවුන්ට ලබා දුන්නේ මහත් සතුටකි.

ඇති තරම් දං අහුලා ගත් දරුවෝ කට දම් පැහැ වන තුරු ඒවා රස විඳීමට සමත් වූහ.

''මේ... මේ දං කෑවා ඇති.  සරුංගල් යවන්නෙ නැද්ද?''



අචිනි ආ කාරණය මතක් කළා ය.

''ඒක නම් ඇත්ත තමා ඒත්... ඉර මාමාත් තවම නිදි... එයාටත් අද නිවාඩු ද දන්නේ නැහැ'' සුමුදු සිනහ වෙමින් කීවා ය.

''ඉර පායන වෙලාවට පායයි. ඔයාලා කලබල වෙන්න එපා'' හිරුණි කීවා ය.

''ඒක නොවේ. වෙල් එළිය හරිම අපූරුයි. අපිට හොඳට සරුංගල් උඩ යවන්න පුළුවනි'' ගයානි වට පිට බලමින් කීවා ය.

''හැබැයි ඊයේ රේඩියෝ එකෙන් කාලගුණ අනාවැකියක් කීවා අපි ඉන්න පැත්තටත් වහිනවා කියලා... බැරිවෙලාවත් වැස්සොත්... සරුංගල්...'' කියමින් සුමුදු අහස දෙස බැලුවා ය.

''මේ... මේ... අව කැපෙන කතා කියන්න එපා. අර පේනවා ද ඉර මාමා හිනහ වෙවී අපි දිහා බලන හැටි'' හිරුණි සූර්ය උදාව පෙන්වමින් කතා කළා ය.

''නැහැ... නැහැ... මම කීවේ... එහෙම වුණොත් කියලා... විතරයි'' සුමුදු බැගෑපත් හඬින් කීවා ය.

''ඔන්න ඔය කතා නවත්තලා අන්න අර ගල උඩට නගිමු'' හිරුණි යෝජනා කළා ය.

''අනේ... සුමුදු මගේ අතේ දං ඔයා මගේ සරුංගලයත් එහෙනම් අරගන්න'' අවිනි ඉල්ලීමක් කළා ය.

''දං කන්නයි සරුංගල් යවන්නයි දෙකක් කරන්න බැහැ... දං ටික කාලා ඉන්න'' සුමුදු දැනමුත්තියක සේ කතා කළා ය.

''නියර දිගේ ඔන්න කවුරුත් පරෙස්සමින් එන්න'' කවදත් නායකත්වය ගන්නා හිරුණි පෙර මඟ ගනිමින් විධාන කළා ය.

''ඔන්න... ඔන්න අව්ව පායලා... හැබැයි... එක පාරට ම අව්ව සැර වුණා නේ?'' අවිනි ඉර දිහා බලා කීවාය.

''ඇයි අනේ... ඉර මාමා අපිත් එක්ක තරහ වෙලා ද?'' සුමුදු තවත් කොටසක් එකතු කළාය.

''ඔන්න... දැන් කවුරුත් හෙමින් හෙමින් ගල උඩට නගින්න. ගයානි, අවිනි බිම ඉන්න. සුමුදු පරෙස්සමින්'' හිරුණි ගලට නඟිමින් කීවා ය.

''ඒක නෙමේ හිරුණි අව්ව හරිම සැරයි... තවම දවල් වුණොත් නැහැ නේ'' ගයානි මැසිවිලි නගන්නට වූවා ය.

''ඇයි ඕවට අපිත් හවුල්... නේ... මතක ද පන්තියේ නිමලා ටීචර් කිව්වා, දැන් පොළව වටේ වායුගෝලයේ කාබන් ඩයොක්සයිඩ් වගේ වායු වැඩිවෙලා. ඒ හින්දා රස්නය ආපහු පිට වෙන ප්‍රමාණය අඩුවෙලා. හරියට වීදුරු ගෙයක් ඇතුළට රස්නය ඇතුල් වෙලා වගේ කියලා.''

'' ඔව්.. ඔව් මට දැනුයි මතක් වුණේ.. ගයානි මතකය අවදි කර ගන්නට තැත් දරමින් කීවාය.''

''අපේ අම්මා නිතරම කියනවා ඉස්සර මේ තරම් රස්නේ නැහැ කියලා. එහෙනම් ඒ කතාව ඇත්ත තමා.''



''ඒ විතරක් ද අර ඈත ගෙවල් තියෙන පැත්ත මහ වනාන්තරයක් ලු. වෙන්දේසියෙන් ඇවිල්ලා කැලෑව ම කපලා ඒකෙ ගෙවල් හදලා විකුණනව ලු... ඉස්සර අපේ ගමට මේ තරම් රස්නේ නැහැ කියලා අපේ ආත්තම්මා නිතර ම කියනවා'' හිරුණි ගලට නැග වාඩිවෙමින් කීවා ය.

''කොහොම... කොහොම හරි... කැලෑව එළිවෙලා. ගෙවල් හැදිලා... එච්චරයි වෙලා තියෙන්නේ. තව ටික කලක් යන කොට අපට මේ වෙල් එළියත් නැතුව යයි ද දන්නේ නැහැ...''

''ඒවායේ ගෙවල් හැදුණොත් සෙල්ලම් කරන්න වෙන්නේ අර පුංචි මිදුලේ තමා'' සුමුදු සුසුමක් හෙළමින් කීවා ය.

''ඔන්න මම ගෙනාව බිස්කට්... කන එකයි ඇත්තේ. පහළ ඉන්න ගයානිටයි... අචිනිටයි දෙන්න... සරුංගල් අරින්නත් හොඳයි වගේ'' වටපිටාව බලමින් හිරුණි පැවසුවේ නැකත උදා වූ පරිද්දෙනි.

''හැබැයි හිරුණි නූල දෙන කොට තමා කල්පනාවෙන් ඉන්න ඕන. සුළඟ වැඩි උනොත් ඔයත් එක්කම සරුංගලය අරන් යයි. ඒ හින්දා කෝකටත් මමත් ඒ ළඟ ම ඉන්නම් කෝ'' සුමුදු නූල් දෙන්නට සූදානමින් කීවා ය.

දරුවෝ සරුංගල් යවන්නට සූදානම් වූහ.

සුළඟ සෙමෙන් වැඩි වෙයි. හිරුණි, සුමුදුත් සමඟ නූල් දෙන්නට විය. ගල පහළ සිටින අචිනිත් ගයානිත් සතුටින් ඔල්වරසන් හඬ දෙති. සරුංගලය සුළඟ සමඟ පොර බදිමින් ලතාවකට ඉහළට ඇදී යන අයුරු අපූරු ය.

හිරු එළිය එන්න එන්න දැඩි වෙන්නට විය. වේගයෙන් ආ සුළං පහරට සරුංගල් ඉහළට ඇදී ගියේය. කුරුල්ලෝ කෑගසන්නට වූහ. අමුතු පරිසරයක් මැවෙන්නට විය.

ගස් කොළන් නොමැති වෙල් එළියේ ගල උඩ සිටි සුමුදු හා හිරුණි සුළඟ හා පොර බදන්නට වූයේ සරුංගලය ද හසුරුවා ගැනීමට නොහැකි වන අයුරිනි.

හිරුණිගේ අතින් සරුංගලය ගිලිහී ගියේ ය. ගල පාමුල සිටි යහළුවෝ කෑ මොර දෙන්නට වූහ. ටිකෙන් ටික හිරු නොපෙනී කළු වලාකුළු මතුවිය.

''ළමයිනේ... ළමයිනේ'' ඒ හඬින් කවුරුත් වට පිට බැලූහ.

''සිමියොන් සීයා නේ ද?''

''ඔය සරුංගල් යැව්වා ඇති... ඉක්මනට ගෙවල්වලට ගියානම්...'' උඩහ ගෙදර සිමියොන් සීයාගේ හඬට දරුවෝ කන් දුන්හ.



''අනේ සීයේ බලන්නකො... සරුංගලය කඩාගෙන ගියා... හැබැයි සුළං තියෙනවා'' සුමුදු දුකින් කීවා ය.

සෙමින් ළඟට පැමිණි සිමියොන් සීයා නොදරුවන් දැනුවත් කරන්නට වූයේ ඉදිරියේ විය හැකි අනතුරු සලකා බලා ය.

''දරුවනේ, පේනවා නේ ද කලින් තිබුණු සැර අව්ව... දැන් කෝ...නෑ නේ. ඒ වැස්ස ළං වුණා ම එහෙමයි. තවත් කතා කර කර ඉන්න බැහැ. ඉක්මනට මෙතනින් යන්න ඕනේ... අනික පාළු පැත්ත.''

සිමියොන් සීයා දරුවන් පිරිස වටකර ගනිමින් කීවේ ය.

''සුළඟෙ සැර... දැනෙනවා ද? ගල උඩ ඉන්න දරුවන් දෙන්නා ඉක්මනට බහින්න. එන්න. එන්න.''

''සීයේ... අනේ සරුංගලය කඩාගෙන ගියා'' හිරුණි අඬන්න ළඟා වූ සේ ගලෙන් බසිමින් කීවා ය.

''දරුවෝ, සරුංගලය වගේ නොවේ ජීවිතය... පේනවා නේද? දැන් මොක ද වෙන්නේ කියලා. ඇරත් ගස් කොළන් නැති පාළු හිස් තැන්වල කොහොමත් ඉන්න හොඳ නැහැ.''

බලා සිටිය දී ම හතර වටින් කළුවර වන්නට විය. සුළං දැඩි වන්නට විය.

‘‘සීයේ...අපට බයයි.’’

දරුවෝ සීයා වටකර ගත්හ.

‘‘තවත් කතා කර කර ඉන්න බැහැ. යමු අර පැල් කොටේ ළඟට... හ්ම්... හ්ම්... ඉක්මන් කෙරුවා නම්.’’



වෙල් එළියේ කෙළවර පිහිටි පැල තුළට සීයා අනුගමනය කරමින් දරුවෝ මුණිවත රකිමින් ඇතුළු වූහ.

''අම්මෝ... ඇති.''

මහ සුළඟත් සමඟ වැහි බිඳු වැටෙන්නට විය. එය මහා වැස්සක් ම විය. අහස දෙපළු කරමින් විදුලි කොටන්නට විය. විදුලි රේඛා අහසේ තරඟයට එහා මෙහා දුවන්නට විය.

''අනේ සීයේ අපට හරි බයයි'' ගයානි අඬන්නට වූවා ය.

''ඩෝං... ඩෝං... ඩීම්... ඩෝං...''

අකුණු එකපිට එක ඇද වැටෙන්නට විය. දරුවෝ දෑත්වලින් කන් වසා සීයා වට කර ගත්හ. සීයා දරුවන් අස්වසාලමින් කතා කරන්නට උත්සාහ ගත්තේය.

''පුතේ... අපි ඉන්නෙත් අවදානම් තැනකයි. අනෙක මම මේ පැත්තෙන් ආපු එක ඔයාලගේ වාසනාව.''

''ඔව් සීයේ...'' සුමුදු වෙව්ලමින් කීවා ය.

''දරුවනේ... අර ඔයාලා හිටපු ගල ළඟට... අර... හෙණයක් ද කොහෙ ද වැටුණේ... අර... ගිනි ජාලාව... මටත් වාරු නැහැ...''

දරුවෝ බියේ දෑත් වලින් කන් වසා සීයාට ළං වී සිටිති.

''අපි අනූනවයෙන් බේරුණේ... සීයේ''

දිරා ගිය වහලය ඇති පැලෙන් වැහි බිඳු වැටෙන්නට විය.

''ළමයිනේ, මේ පැත්තට ආවා නම්'' සීයා ඔවුන්ගේ බිය හඳුනාගෙන කතා කළේ ය.

''වැස්ස තව ටිකකින් තුරල් වෙලා යයි. මීට පස්සෙවත් වැහි අන්ධකාරයක් තියෙන වෙලාවට පාළු හිස් පිට්ටනි, වෙල්වල ඉන්න හොඳ නැහැ.''

''සීයේ... අපි එන වෙලාවේ වැස්සක ලකුණක්වත් තිබුනේ නැහැ... දැන් නේ වැස්ස පටන් ගත්තේ''.

'' ඒ කොහොම නමුත් ඔයාලා අද පාඩමක් ඉගෙන ගත්තා.''

''මොන වෙලාවකවත් අකුණු කොටන කොට, වහින කොට පාළු පිට්ටනි, කඳු මුදුන්, වෙල් එළිවල ඉන්නට හොඳ නැහැ... හරිම භයානකයි''.

''දරුවනේ... අද මම ඔයාලට කතා කරන විට ආවෙ නැති ව සෙල්ලම් කළා නම් ජීවිත හානිත් වෙන්න තිබුණා''



''දැක්කා නේ ඔයා ලා නැගල හිටපු ගල ළඟට අකුණු වැදිච්ච විදිය''.

සීයා සිද්ධ වෙන්නට ගිය විනාශයක් මතක් කළේ එලෙස ය.

වැස්ස හෙමින් හෙමින් නතර වෙන අයුරු පෙනේ. හිරිකඩවලින් දරුවෝ තෙමී ඇත. ඊටත් වඩා බය වී ඇත.

වෙල් ඉපනැල්ල මොහොතකින් වතුරෙන් පිරී ගියේ ය. අසල සිටි ගෙම්බෝ බක බක ගා ප්‍රීති ගීත ගායනා කළහ.

රැහැයියන්ගේ හඬ ද ඊට එක් වී ඇත. තවම අඳුර දුරු වී නැත. සෙමින් සෙමින් ඕවිට අසලට ගිය සීයා හීන් පොදේ තෙමි තෙමී හබරල කොළ කීපයක් කඩා ගෙන ආවේ ය.

''හරි... තවත් බලාගෙන ඉඳල වැඩක් නැහැ... මෙන්න මේ හබරල කොළේ ඔළුව උඩින් තබා ගන්න'' සීයා දරුවන්ට විධානය කළේ ය.

''දරුවනේ, වැස්ස අඩුවෙනකම් ටිකක් තොරතුරු කියන්නම්. හැබැයි මේවා ඔයාලට හරිම වැදගත් වේවි. පුතේ ගිගුරුම් හඬක් ඇසුණොත් අකුණක් වැදිය හැකි පැත්තක සිටින බව දැන ගන්න ඕනේ''

''ඒ විතරක් නෙමේ කැලයක ඉන්නවානම් උස ගස් යටට යන්න හොඳ නැහැ.''

''සීයේ, අපි හිටියේ අර ගල උඩයි. හොඳ වෙලාවට සීයා අපට කතා කළේ'' හිරුණි බිය වූ නෙතින් වට පිට බලමින් කීවා ය.

''ඒ දරුවනේ... ගෙදරින් පිට නේ... ගෙදර ඉන්න වෙලාවක නම් උදලු, අලවංගු වගේ උපකරණ සම්බන්ධ කරගෙන කරන වැඩ කටයුතු නවත්වා දමන්න ඕනේ''

''දැන් දරුවනේ... දැක්ක නේ සුළඟ, අකුණු මොහොතකට කරපු දේ... අර ගල ළඟ... අර... අර... බලන්න... මට හිතෙනවා පූරුවේ පිනකට මාව මෙතැනින් එව්වා කියලා.''

''අනේ සීයේ අම්මලා හොඳට ම බයවෙලා ඇති'' අචිනි කොඳුරන්නට වූවා ය.

''දැන්... වැස්ස ටික ටික අඩු වෙනවා... එතකොට අපි ගෙදර යමුකෝ...'' සීයා දරුවන් සනසවමින් පැවසුවේ ය.

''සීයේ... සීයේ... මීට පස්සේ නම් අනතුරු දකින කොට ඉක්මනට සීයා කී විධියට වැඩ කරනවා'' ගයානි කීවේ වෙන්නට ගිය අනතුරු ඇස් පනාපිට ම දුටු හෙයිනි.



දරුවනේ, තවත් කාරණාවක් කියන්නට ඕනේ..

''ගොරවනකොට දුරකථන පාවිච්චි කරන්නත් හොඳ නැහැ'' සීයා දරුවන් දැනුවත් කළේ අවවාදය වුවත් ගැළපෙන තැනට ම දිය යුතු ආකාරයට ය.

''ඉතින් දරුවනේ, මම කිව්වේ මේ දිනවල අනතුරු වැඩියි නේ. හැබැයි... අපට ඒවායින් ආරක්ෂා වෙන්නට පුළුවන්. මේවා අපි වැඩිහිටියන් අතින් සිද්ධ වෙන්න ඕනේ දේවල් නේ'' සීයා දරුවන්ගේ හිස් අතගාමින් කීවේ ය.

''හා... හා... යමු. දැන් ඔය හබරල කොළ ඔළුව උඩින් තියාගත්තා නම්'' සීයා පෙර මගට විත් දරුවන්ට අණ කළේ නියම වැඩිහිටියෙකු මෙනි.

සීයා පසු පස වැටුණු දරුවෝ තෙමිච්ච කුකුළන් මෙන් ගෙවල් බලා ඇදුණහ. කවදත් කටකාර හිරුණි අද ගොළු වී ඇත. ඒත් ඇය සීයාට ස්තූති කළේ,

''වැස්සේ තෙමි තෙමී නාන මම අද පාඩමක් ඉගෙන ගත්තා'' කියමිනි.

සුමුදු මින් පසු කිසිම දිනක පිට්ටනිවල, වෙල්එළිවල, ගොරවන විට, අකුණු ගහන විට නොසිටින බව ගයානිගේ කණට කර කීවා ය. ගයානිත් අචිනිත් අද සරුංගල් ඇරියාට වඩා හොඳ පාඩමක් උඩහ ගෙදර සිමියොන් සීයාගෙන් ඉගෙන ගත් බව ප්‍රකාශ කළහ.

උඩහ ගෙදර සිමියොන් සීයා ගැමියෙකු වුවත් දරුවන්ට දුන් අවවාද මසුරන් වටිනා බව පසු දින හිරුණිගේ අම්මා තාත්තා සමග කියනවා හිරුණි ද අසා සිටියා ය.

ISBN 978-955-590-099-7

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස
කොළඹ 07

*දුරකථනය: 011-2696771-3* *ෆැක්ස්: 011-2694754*